# නාලන්දා විද්‍යාලය - කොළඹ 10

## ඒකක පරීක්ෂණය

07 ශ්‍රේණිය | විද්‍යාව | ඒකකය 18 - ඛනිජ හා පාෂාණ

## A කොටස

- **නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

(1) ''තිරුවානා'' හැඳින්වෙන තවත් නමකි,
1) පෙල්ස්පාර් 2) ක්වාට්ස් 3) මයිකා 4) ඇපටයිට්

(2) හුණුගල් විපරිත වීමෙන් සෑදෙන්නේ,
1) ග්‍රැනයිට් 2) මිනිරන් 3) නයිස් 4) කිරිගරුඬ

(3) නිශ්චිත ජ්‍යාමිතික හැඩයෙන් යුතු ජ්ඵටිකයකි.
1) ඩොලමයිට් 2) ග්‍රැනයිට් 3) කිරිගරුඬ 4) නයිස්

(4) අවසාදිත පාෂාණයකට උදාහරණයකි,
1) ග්‍රැනයිට් 2) ඉල්මනයිට් 3) හුණුගල් 4) මයිකා

(5) පාෂාණ ජීර්ණය සිදුවන භෞතික ක්‍රමයක් නොවන්නේ,
1) රත්වී ඇති පාෂාණ ක්ෂණිකව සිසිල් වීම මගින්.
2) පාෂාණ මගින් ජලය ගලා යාම මගින්.
3) පාෂාණවල ඇති කුහර තුළ ජලය රැස්වී ඒවා අයිස් බවට පත් වීම මගින්.
4) පාෂාණවල ඇති කුහර තුළට කුඩා ශාකයක මුල් ඇතුළු වී විශාල වීම මගින්.

(6) තීන්ත නිෂ්පාදනය සඳහා යොදා ගන්නා ඛනිජයකි.
1) ෆෙල්ස්පාර් 2) ඉල්මනයිට් 3) ඩොලමයිට් 4) ඇපටයිට්

(7) අධික පීඩනය හා අධික උෂ්ණත්වය නිසා හටගන්නා පාෂාණයකි.
1) විපරිත පාෂාණ 2) ආග්නේය පාෂාණ 3) අවසාදිත පාෂාණ 4) වටපිඩු පාෂාණ

(8) ඇපටයිට් බහුලව ඇති ප්‍රදේශයකි,
1) පුල්මුඩේ 2) මාදම්පේ 3) බෝගල 4) එප්පාවල

(9) පොළොව අභ්‍යන්තරයට හෑරීමේදී තව දුරටත් හෑරිය නොහැකි පාෂාණයක් හමුවේ. එය හඳුන්වන නම,
1) ඝන පාෂාණයයි 2) මව් පාෂාණයයි
3) ආග්නේය පාෂාණයයි 4) විපරිත පාෂාණයයි

(10) පෘථිවියේ මතුපිට සිට 30 km ක් පමණ ගැඹුරෙහි උෂ්ණත්වය,
1) 8000 °C 2) 50000 °C 3) 5000 °C 4) 3000 °C

## B කොටස

(1) 1) පහත දක්වා ඇති ද්‍රව්‍ය පාෂාණ හා ඛනිජ වලට වෙන් කරන්න.

**මිනිරන්, ෂිස්ට්, තිරිවාන, කිරි ගරුඬ, බැසෝල්ට්, මැණික්**

| පාෂාණ | ඛණිජ |
|---|---|
| | |

2) වගන්ති නිවැරදිනම් ✓ ලකුණත් වැරදි × නම් ලකුණත් යොදන්න.

a) පාෂාණ ජීර්ණයෙන් පස සෑදේ. ( )
b) ඛනිජයක් සෑදෙන්නේ එක් සංඝටකයකිනි. ( )
c) පාෂාණයක් ස්ඵටිකරූපී ද්‍රව්‍යයකි. ( )
d) ග්‍රැනයිට් හා නයිස් එදිනෙදා ව්‍යවහාරයේ දී කළුගල් නමින් හැඳින්වේ. ( )
e) ලාවා සිසිල් වීමෙන් මැග්මා සෑදේ. ( )
f) අවසාදිත පාෂාණ තද බවින් අඩුම පාෂාණ වර්ගයයි. ( )
g) පොස්පේට් පොහොර නිෂ්පාදනයට ඩොලමයිට් යොදා ගනී. ( )

(2) 1) පාෂාණ ඛණිජ වලින් වෙනස් වන්නේ කෙසේද? වගුව තුල කරුණු 2 ක් සඳහන් කරන්න.

| පාෂාණ | ඛණිජ |
|---|---|
| 1.<br><br>2. | |

2) හිස්තැන් පුරවන්න.

a) අවසාදිත පාෂාණයක් වන ....................................... විපරීත වී කිරි ගරුඬ සෑදේ.
b) ....................................... පාෂාණයක් වන ග්‍රැනයිට් විපරීත වී ....................................... සෑදේ.
c) ලයිකා යනු ....................................... හා දිලීර වල එකතුවකි.

3) අම්ල වැසි ඇති කිරීමට හේතු වන වායු 2 ක් නම් කරන්න.

4) අම්ල මගින් පාෂාණ ජීර්ණය වේදැයි පරීක්ෂා කිරීමට ඔබ සපයා ගත යුතු ද්‍රව්‍ය දෙක නම් කරන්න.

(3) 1) පහත දක්වා ඇති පාෂාණ චක්‍රයේ හිස්තැන් පුරවන්න.




2) ඛණිජ හා පාෂාණ අපට ඉතා වටිනා ස්වාභාවික සම්පත් වේ. මේවායේ ''තිරසර භාවිතය'' යන්නෙන් අදහස් වන්නේ කුමක් ද?

3) විදුලි හා ඉලෙක්ට්‍රොනික උපකරණ සඳහා ප්‍රයෝජනවත් වන ඛණිජය කුමක් ද?

4) ශ්‍රී ලංකාවේ පොස්පේට් පොහොර නිෂ්පාදනය කරන කර්මාන්ත ශාලාව පිහිටා ඇත්තේ කොහේ ද?

5) අනාගතයේදී ඉන්දියාවේ ටජ්මහල් වැනි වටිනා නිර්මාණ විනාශ වී යාමේ අවධානමක් ඇත. මෙය ඔබ උගත් දේ ඇසුරින් පැහැදිලි කරන්න.

සැකසුම - කේ. වී. සී. ප්‍රියදර්ශනී මිය